සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

කෘෂි විද්‍යාව II
விவசாய விஞ்ஞானம் II
Agricultural Science II

08 S II

## B කොටස - රචනා

**උපදෙස් :**

※ ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.
※ අවශ්‍ය තැන්හි දී නම් කරන ලද පැහැදිලි රූප සටහන් දෙන්න.
(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය **150** කි.)

**5.** (i) කෘෂිකර්මාන්තයේ දී වල්පැළවල අනර්ථකාරී බලපෑම විස්තර කරන්න.
(ii) බෝග ක්ෂේත්‍රවල ජල සම්පාදන කාර්යක්ෂමතාව වැඩිදියුණු කරන ක්‍රම විස්තර කරන්න.
(iii) ආහාර නිෂ්පාදන විවිධාංගීකරණයේ වාසි, අවාසි සහ සීමාවන් විස්තර කරන්න.

**6.** (i) ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය භාවිතයේ පාරිසරික ප්‍රතිලාභ විස්තර කරන්න.
(ii) ව්‍යාපාර සම්පත්වල වැදගත්කම සහ කළමනාකරණය විස්තර කරන්න.
(iii) පාංශු ඛාදනයට බලපාන සාධක විස්තර කරන්න.

**7.** (i) ශ්‍රී ලංකාවේ වී වෙළෙඳපොළ මත පොහොර සහනාධාරයේ බලපෑම පැහැදිලි කරන්න.
(ii) ශාක වර්ධනය කෙරෙහි උත්ස්වේදනයේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න.
(iii) කෘෂිකර්මාන්තයේ දී දත්ත කළමනාකරණයේ වැදගත්කම විස්තර කරන්න.

**8.** (i) ශ්‍රී ලංකාවේ ජාන සංරක්ෂණයේ වැදගත්කම සහ ජාන සංරක්ෂණ ක්‍රම විස්තර කරන්න.
(ii) පටක රෝපණ විද්‍යාගාරයක ප්‍රධාන අංග සඳහන් කර, එම එක් එක් අංගයේ ප්‍රධාන කාර්යය විස්තර කරන්න.
(iii) කෘෂිකර්මාන්තයේ දී යොදා ගනු ලබන ඒකාබද්ධ ශාක පෝෂක කළමනාකරණ (IPNM) ක්‍රියා විස්තර කරන්න.

**9.** (i) ඝන ආස්තරණ නිවාසයක බිත්තර දමන ආකාරයේ කිකිළි පැටවුන් රංචුවක් දිනක වයසේ සිට සති **8** ක් දක්වා රැක බලා ගැනීමේ දී අනුගමනය කළ යුතු වැදගත් පාලන ක්‍රියා විස්තර කරන්න.
(ii) ඇල්බර්ට්ගේ ද්‍රාවණය **(Albert Solution)** යොදා ගනිමින් නිර්පාංශු වගාවක් සඳහා පෝෂක ද්‍රාවණයක් සකසන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න.
(iii) බිම සැකසීමේ දී යන්ත්‍ර සූත්‍ර යොදාගැනීම, පසට සහ පරිසරයට බලපාන්නේ කෙසේ දැයි විස්තර කරන්න.

**10.** (i) කෘෂි කාලගුණික ඒකකයක් සඳහා අත්‍යාවශ්‍ය උපකරණ විස්තර කරන්න.
(ii) එළවළු සැකසීමේ දී යොදාගනු ලබන සුලිකරණ ක්‍රම විස්තර කර, සුලිකරණයේ වාසි සහ සීමාවන් සඳහන් කරන්න.
(iii) බෝග මාරුවෙහි වාසි විස්තර කරන්න.

※ ※ ※